ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය
இலங்கையின் பிரதம அமைச்சர்
**Prime Minister of Sri Lanka**

## නිදහස් දින පණිවිඩය

බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලැබීමේ 75වන සංවත්සරය නමැති අතිශය වැදගත් සන්ධිස්ථානයක් අද දින සමරන්නෙමු.

අප අතරින් සාතිශය බහුතරයක් විසින් නිදහස් ශ්‍රී ලංකාවක් තුළ උපත ලැබීමේ භාග්‍යය ප්‍රකාශ කරනු පිණිස මෙම අවස්ථාව සමරනු ලබන අතර, මෙම වැදගත් කඩඉම සනිටුහන් කරනු පිණිස අපගේ ජාතික ධජය එසැවීමට ලැබීම පිළිබඳ ආඩම්බර වෙමු. 1948 පෙබරවාරි මස 4වන දිනට පෙර ඉපිද බ්‍රිතාන්‍ය පාලනයට යටත්ව ජීවත් වූවන් විසින් අත්විඳි දුක් වේදනාවන්හි කටුකත්වය හා අප උදෙසා නිදහස දිනා දෙනු පිණිස අපගේ මුතුන් මිත්තන් විසින් ගෙන ගිය අරගලයන් පිළිබඳව මෙනෙහි කිරීමටද මෙය අවස්ථාවක් වේ.

1815 මාර්තු මස 2වන දින නමැති ශෝකජනක දින යටත් වීමේ ගිවිසුම අත්සන් කිරීමට පැය කිහිපයකට පෙර බ්‍රිතාන්‍ය ධජය ඔසවන ලද අවස්ථාවේ එය වාරියපොළ ශ්‍රී සුමංගල හිමියන් විසින් ඉවත් කරන ලද මොහොතේදීම ශ්‍රී ලංකාව තුළ විදේශ ආධිපත්‍යය පිළිකුල් කරමින් එයට එරෙහි වීමේ ජීව ශක්තියේ ආරම්භයද ඇතිවිය.

අද දින අප විසින් අපගේ නිදහස සමරනු පමණක් නොව ඒ උදෙසා සටන් කළ පිරිස්, අපගේ රට වෙනුවෙන් දැක්මක් සහිතව සිටි අය හා ඒ වෙනුවෙන් සිය ජීවිත පූජා කළ පිරිස් වෙතද උපහාර දක්වන්නෙමු. මව්බිමේ නිදහස උදෙසා වූ ස්වකීය අරගලය තුළ අපගේ මුතුන් මිත්තන් විසින් විදහා දක්වන ලද නිර්භීතභාවය හා වීර ක්‍රියාවන් මෙන්ම විඳි අපමණ දුක් වේදනාවන්ද අප මතකයන්ගෙන් වියැකී යාමට අවකාශ නොසැලසිය යුතුව පවතී.

1818 ඌව-වෙල්ලස්ස හා 1848 මාතලේ ඇතිවූ මහා කැරලි හරහා සිදුකරන ලද අප්‍රමාණ වූ කැප කිරීම් හා අත් විඳි අප්‍රමාණ දුක් වේදනාවන් සනිටුහන් කෙරුණු අතර, පසුගිය සියවස තුළ අවිහිංසාවාදී නිදහස් අරගලයක්ද සිදුවිය. අනගාරික ධර්මපාල, ඩී.බී. ජයතිලක, එෆ්.ආර්. හා ඩී.එස්. සේනානායක, හෙන්රි පේද්‍රිස්, ටී.බී. ජයා, පොන්නම්බලම් රාමනාතන්, එන්.එම්. පෙරේරා, පිලිප් ගුණවර්ධන, එස්.ඒ. වික්‍රමසිංහ වැනි නායකයන්ගේ සිට අන් බොහෝ අය දක්වාද විහිදුණු නායක පෙළ විසින් නිදහස් ව්‍යාපාරය සාර්ථකත්වය කරා රැගෙන යන ලදී.

පසුගිය වසර 75ක කාලය පුරා අන්තවාදීන්ගෙන් හා බෙදුම්වාදීන්ගෙන් මෙලෙස අසීරුවෙන් දිනාගත් නිදහස රැක සුරක්ෂා කිරීම උදෙසා ඒ හා සමාන කැපකිරීම් සිදුකරන ලද වීරෝදාර සන්නද්ධ හමුදා සාමාජිකයන් වෙතද අපගේ ප්‍රණාමය පුද කළ යුතුව පවතී.

නිදහස් ජාතියක් ලෙස සුවිශාල ප්‍රගතියක් අත්කර ගනිමින්, සැබෑ තරුණ බලවේගයක් ගොඩනඟා, ජනතාව වෙත විශිෂ්ට සෞඛ්‍ය හා අධ්‍යාපන සේවයක් ලබා දීමට අපට හැකිවිය. කෙසේ වුවද, පසුගිය කාලය තුළ ආර්ථික පසුබෑමකට තුඩු දෙන ස්වභාවයේ අභියෝග ගණනාවකට මුහුණ දෙන්නට අපගේ රටට සිදුවිය. ස්වයංපෝෂිත බව හා ආහාර සුරක්ෂිතතාවය සාක්ෂාත් කරගනු පිණිස කෘෂිකාර්මික නිෂ්පාදන වර්ධනය කරගන්නා අතරතුර ආර්ථිකය යථා තත්ත්වයට පත් කරනු ලබන බවට වගබලාගැනීමේ අරමුණින් රජය විසින් ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන ඇත. අපගේ දැඩි අභිලාශය වනුයේ අභියෝග ජය ගනිමින් ආර්ථිකමය වශයෙන් යහපත් වූ ප්‍රගතිශීලී ජාතියක් ගොඩනැගීමයි.

මෙරට සාඩම්බර පුරවැසියන් ලෙස, එක්ව කටයුතු කරමින් අප රටතුළ වර්ධන හා සංවර්ධන පරිවර්තනයක් ඇති කිරීම උදෙසා වූ යුතුකම නිර්ව්‍යාජ ලෙස ඉටු කිරීම අපගේ වගකීමයි.

නිදහස දිනාගැනීම උදෙසා අපගේ මුතුන් මිත්තන් විසින් කරන ලද කැප කිරීම් සිත්හි දරා ගනිමින්, අපගේ මාතෘභූමිය වෙනුවෙන් වඩා යහපත් අනාගතයක් උදා කරන බවට අප විසින් ශපථ කළ යුතුව පවතී.

**දිනේෂ් ගුණවර්ධන**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය

2023.01.16